# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1739/5 - 2012 ජනවාරි 02 වැනි සඳුදා - 2012.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තිය යටතේ පැවැත්වෙන පරීක්ෂණය**

වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍ය විජේසිංහ හෙට්ටිඅච්චි මුදියන්සේලාගේ අතුල සරත් කුමාර විජේසිංහ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියෙහි සඳහන් විධිවිධාන වලට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වූ මහව ප්‍රාදේශීය සභාවේ සභාපති සේනානායක මුදියන්සේලාගේ බන්දුල පුෂ්පකුමාර සේනානායක මහතා විසින් සභාපති වශයෙන් කටයුතු කිරීමේදී ඉහත කී පනතේ 185 වගන්තිය යටතේ දක්වනු ලබන වරදවල් සිදුකර තිබේද යන්න පරීක්ෂා කර මාස 03 ක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1720/7 - 2011 අගෝස්තු මස 24 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පත්කරන ලද විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු ඕ. ඩබ්. ඕ. බී. වීරසේන මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා පරීක්ෂණ කාලය 2012 මාර්තු මස 15 වැනි දින දක්වා දීර්ඝ කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
(වයඹ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ
මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය පළාත් පාලන හා
පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
ඉඩම් ප්‍රවාහන, පරිසර, සංචාරක ආයෝජන, සම්බන්ධීකරණ,
සමුපකාර සංවර්ධන සහ ආහාර සැපයුම් විෂයභාර අමාත්‍ය.)

2012 ජනවාරි මස 02 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

01 - 397


1A - PG 001327 — 345 (2012/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.